ආයතනයේ නම: විදේශ කටයුතු අමාත්‍යාංශය

ස්ථාවර නියෝග අංක 119 (4) ප්‍රකාරව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගෙන ඇති පියවර ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்: வெளிநாட்டு அலுவல்கள் அமைச்சு

பொதுக் கணக்குக் குழுவினால் நிலையியற் கட்டளை எண். 119 (4) ன் பிரகாரம்சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக எடுக்கப்பட்ட நடவடிக்கைகள்மற்றும்கௌரவ அமைச்சரின் அவதானிப்புகளை சமர்ப்பித்தல்

**Name of the Institution: Ministry of Foreign Affairs**

**Submission of Observations of Hon. Minister and the Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : අංක 183

ආයතනයේ නම : විදේශ කටයුතු අමාත්‍යාංශය

<u>01 කොටස</u>

| | කමිටුව මගින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය නියමිත දිනට ඉදිරිපත් කර නැත | 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කල යුතු දිනය වන 2021.02.28 දිනට පෙර, එනම්, 2021.02.25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. *(ඇමුණුම 01).*<br><br>2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කල යුතු දිනය වන 2022.02.28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2022 මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කල යුතු දිනය වන 2023.02.28 දින හෝ දිනට පෙර ඉදිරිපත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 02. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නැත. | හානි පිළිබඳ ලේඛනය 2021 වසරෙහි සිට පවත්වාගෙන යනු ලබන අතර 2021 වසරෙහි සිට හානි පිළිබඳ තොරතුරු ඇත. ඒ අනුව, හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| 03. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අමාත්‍යාංශයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සහ සුමට ක්‍රියාකාරිත්වය, සැලසුම් කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම අඩාල වී තිබුණි. කෙසේ වෙතත්, 2021 සහ 2022 වසර සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් නියමිත පරිදි සකස් කර ඇති අතර, ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර ඇති පරිදි සිදු කෙරේ. |
| 04. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විදේශ දූත මණ්ඩලවලින් තොරතුරු රැස් කළ යුතු බැවින්, ඒ සඳහා මාස 01කට වඩා කාලයක් ගත වේ. තවද, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේදී අවශ්‍ය තොරතුරු රැස්කිරීමේදී බාධා සිදුවිය. පසුගිය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම ගැටළුව සාකච්ඡා කල අතර ඒ අනුව අවශ්‍යතාවලට අනුකූල වන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| 05. | කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක I-2019 අනුව විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි. | 2020 වසරේ රටේ පැවැති තත්ත්වය හේතුවෙන් නියාමන අවශ්‍යතා අනුව කමිටු රැස්වීම පැවැත්වීමට අදාළ නිලධාරීන් කැඳවීම ප්‍රායෝගිකව අපහසු විය. කෙසේ වෙතත්, තත්ත්වය යථා තත්ත්වයට පත්වීමෙන් පසු 2022.10.19 වන දින රැස්වීමක් පැවැත්වූ අතර 2023 දී චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුව රැස්වීම කැඳවීමට කටයුතු යොදා ඇත. ***(ඇමුණුම 02 – 2023 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාලසටහන)*** |
| 06. | 2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය නිමකර නියමිත | රෙගුලාසීන්ට අනුකූලව නියමිත වේලාවට භාණ්ඩ සමීක්ෂණ කමිටු පත් කළද, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට පෙර අවසන් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, 2021 වර්ෂය |

| | | |
|---|---|---|
| | දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සාර්ථකව නිම කරන ලද අතර, චක්‍රලේඛ අවශ්‍යතා අනුව 2022 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. |
| 07. | 2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉහත 6 ඡේදයේ දක්වා ඇති හේතු නිසා අත්හැර දැමීමේ සහ කපා හැරීමේ නියාමන අවශ්‍යතාවය ද ප්‍රමාද විය. භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවන්ට අදාළ නියමිත ක්‍රියා පටිපාටි කටයුතු නැවත ආරම්භ කර ඇත. |
| 08. | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | අදාළ කාලසීමාව තුළ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අමාත්‍යාංශයේ වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීම රෙගුලාසිවලට අනුව සිදු කර නොමැත. කෙසේ වෙතත්, ඉන්ධන පරීක්ෂාව 2021 නොවැම්බර් මාසයේදී පවත්වන ලද අතර 2022.04.01 දින සිට ගැලපුම් ක්‍රියාත්මක කරන ලදී. |
| 09. | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි | නිරවුල් නොවූ සහ හඳුනා නොගත් ශේෂයන් සම්බන්ධ තොරතුරු, අඛණ්ඩව එක්රැස් කර නිරවුල් කරමින් පවතී. රු. 612,729.00 ක මුදලක් නිරවුල් කරන ලද අතර ඒ අනුව මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| 10. | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | අදාළ තොරතුරු ලබා ගැනීමෙන් වර්ෂයකට වැඩි නොගෙවූ මුදල් පියවීමට කටයුතු යොදා ඇත. රු. 353,504.00 ක මුදලක් නිරවුල් කරන ලද අතර ඒ අනුව මුදල් රෙගුලාසිවලට අනුකූල වන ලෙස නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| 11. | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලබාගෙන ඇති තොරතුරු පරිදි, කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. |
| 12. | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය වැනි අපගේ පාලනයෙන් බැහැර තත්ත්වයන් මත සිදුවූ ප්‍රමාදවීම් කිහිපයක් වාර්තා වී ඇත. කෙසේවුවද, ලබා ගන්නා ලද තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමේදී මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ අවශ්‍යතාවලට අනුකූල වීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත. |
| 13. | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් | ඉහත 12 ඡේදයේ සඳහන් කර ඇති හේතු නිසා වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද වුවද 2021 |

| | | |
|---|---|---|
| | කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කර ඇත. මේ අනුව චක්‍රලේඛ නියමයන්ට අනුව 2022 කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 14. | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි. | දූත මණ්ඩලවල සේවය කළ නිලධාරීන් නැවත අමාත්‍යාංශයට පැමිණෙන තුරු, මෙම අමාත්‍යාංශය විසින් අනුමත කාර්ය මණ්ඩලයට අමතරව අමතර සේවක සංඛ්‍යාවක් තාවකාලිකව පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, අභ්‍යන්තර සේවක සංඛ්‍යා සමාලෝචනය තුළින් මෙම අමාත්‍යාංශයේ අවම සේවක සංඛ්‍යාව හඳුනාගෙන නව සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. |

**02 කොටස**

| | කමිටුව මගින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන අරමුණු හා සම්බන්ධ කිසිදු ව්‍යාපෘතියක් මෙම විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක නොකෙරේ. මෙම අමාත්‍යාංශය ගරු ලේකම්,අගමැති,අමාත්‍යාංශය පිළිබඳ ජාතික පාලන කමිටුවේ කොටසකි. මුදල් අමාත්‍යාංශය සමග සහයෝගිතාවයෙන් මෙම අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතාවය දියත් කිරීමේ දී ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය පිළිබිඹු කරන 2023 සිට 2027 සඳහා වූ රාමුව (UNSDCF) හා තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුකූල ප්‍රමුඛතා ද , රජයේ පාර්ශවකරුවන් හා එක්සත් ජාතීන් අතර සම්බන්ධීකරණය සඳහා පහසුකම් සපයනු ඇත. ජාත්‍යාන්තර මට්ටමින් තිරසාර සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සන්නිවේදනය කිරීමේ අරමුණින් SDG පිළිබඳ බහුපාර්ශවික සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලංකාවට සහභාගීවීමට අමාත්‍යාංශය සැලකිය යුතු ලෙස පහසුකම් සපයයි. එමෙන්ම තිරසාර සංවර්ධනයේ ජාත්‍යාන්තර වර්ධනයන් පිළිබඳව අමාත්‍යාංශය තිරසාර සංවර්ධන කවුන්සිලයට උපදෙස් දෙයි. එක්සත් ජාතීන්ගේ හා මානව හිමිකම් අංශය ඉහත ප්‍රධාන අංශය වන අතර අතිරේක ලේකම් බහු පාර්ශ්වීය කටයුතු, මෙහිලා ප්‍රධාන කාර්ය භාරයක් කේන්ද්‍රීය ලෙස ඉටු කරයි. |
| 02. | හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි. | |
| 03. | ආයතනයේ තිරසර ඉලක්ක ලඟාකර ගැනීමට අදාල වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි. | |
| 04. | 2018 අංක 27 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටුකල යුතු තිරසර කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයින් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. | |
| 05. | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක පුහුණුවක් නියම කර නොතිබුණි. | 2020 වසරේදී රට තුල පැවතුණු තත්ත්වය නිසා සෑම නිලධාරියෙකුමට පැය 12ක පුහුණු වැඩසටහනක් පැවැත්වීම දුෂ්කර විය. කෙසේ වුවද, 2023 වසර තුලදී විෂය හා චක්‍රලේඛ උපදෙස් අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| 06. | සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුව බොහෝ නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම වාර්ෂිකව සිදු කර ඇත. කෙසේ වෙතත්, සම්පූර්ණ කාර්ය මණ්ඩල අවශ්‍යතා ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් නැවත සමාලෝචනය කර සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| 07. | විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී ඇති අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි. | විගණකාධිපතිවරයාගේ අදහස් නිසි පරිදි සලකා බලා ඇති අතර ඒ අනුව යම් යම් අඩුපාඩු නිවැරදි කිරීමට කරන ලදී. මීට අමතරව, පසුගිය කාල සීමාවට අදාළ අදහස් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. |

අරුණි විජේවර්ධන

ලේකම් / විදේශ කටයුතු අමාත්‍යාංශය

H 0493

| දිනය<br>திகதி<br>Date | විස්තරය<br>விபரம்<br>Description | යවනු ලබන්නේ කාට ද<br>யாருக்கு<br>To | පණිවුඩකරුගේ නම<br>சேவகர் பெயர்<br>Name of Messenger | යැවූ වේලාව<br>அனுப்பிய நேரம்<br>Time sent | ලැබුණු වේලාව<br>பெற்ற நேரம்<br>Time received |
|---|---|---|---|---|---|
| 25/02/2021 | FM/FIN/CU02/2020 | | | | |
| | (1) විදේශ 112 - අමාත්‍යාංශය | මුද්‍රිත ප්‍රකාශන 2020<br>* සිංහල 03<br>* ඉංග්‍රීසි 03 | විගණකාධිපති රජයේ විගණන අංශය | | [signature] 25/02/2021 |
| | (2) කලාපීය 419 - සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශය | මුද්‍රිත ප්‍රකාශන 2020<br>* සිංහල 03<br>* ඉංග්‍රීසි 03 | විගණකාධිපති | | [signature] 25/02/2021 |
| | (3) 112 - විදේශ අමාත්‍යාංශය, අත්තිකාරම් "බී"<br>419 - කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශය " " | | | | |

| විස්තරය<br>விபரம்<br>Description |
|---|
| 112 - විදේශ අමා... |
| FM/FIN/CU/01/... Closing the o... Charted Bank a... |

**Annex 01**

**Annex 02**

**Scheduled dates for held the Audit and Management Committee Meetings – 2023**

**Ministry of Foreign Affairs**

| **1st Quarter** | **2nd Quarter** | **3rd Quarter** | **4th Quarter** |
|---|---|---|---|
| 23rd February | 11th May | 10th August | 23rd November |

**** The scheduled dates may be subject to the change due to situations beyond the control of the chairperson, members and observers.**

**Annex 02**

**Scheduled dates for held the Audit and Management Committee Meetings – 2023**

**Ministry of Foreign Affairs**

| **1st Quarter** | **2nd Quarter** | **3rd Quarter** | **4th Quarter** |
|---|---|---|---|
| 23rd February | 11th May | 10th August | 23rd November |

**** The scheduled dates may be subject to the change due to situations beyond the control of the chairperson, members and observers.**